# 1 ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රය

**හැඳින්වීම**

ඉතිහාසය හැදෑරීමට මූලාශ්‍රය අවශ්‍ය වේ. අතීතය පිළිබඳ තොරතුරු ලබාගත හැකි මූලාශ්‍රය විවිධ ය. මෙම ඒකකයේ දී මූලාශ්‍රය හඳුනා ගැනීම, මූලාශ්‍රය තොරතුරු මත ඉතිහාසය ගොඩනැගෙන ආකාරය සහ ඉතිහාසය හැදෑරීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන පිළිබඳ ඔබට ඉගෙනීමට ලැබෙනු ඇත.

## 1.1 මූලාශ්‍රය වර්ගීකරණය

ඉතිහාසය යනු අතීත මිනිස් ක්‍රියාකාරකම් පිළිබඳ හදරන විෂයකි. අවුරුදු සිය දහස් ගණන් ඈත කාලයේ ඉතිහාසය හැදෑරීමේ දී ඒ ඒ අවධිවල මිනිසුන් ලියා තැබූ දේ හා ඔවුන්ගේ විවිධ නිර්මාණ අපට දක්නට ලැබේ. එම ලේඛන හෝ නිර්මාණ මඟින් අතීත මිනිස් කටයුතු පිළිබඳ තොරතුරු ලබාගත හැකි නිසා ඒවා මූලාශ්‍රය ලෙස හැඳින්වේ. එක් එක් අවධිවලට අදාළව ලැබෙන මෙබඳු මූලාශ්‍රය මඟින් ඒ ඒ කාල වකවානු හා සමාජ පරිසරය පිළිබඳ කිසියම් අවබෝධයක් ලබාගත හැකි ය. මෙසේ මූලාශ්‍රයවලින් ලබා ගන්නා තොරතුරු තර්කානුකූලව හැදෑරීමෙන් එක් එක් කාලපරිච්ඡේදවල ජන ජීවිතය පිළිබඳ ඉතිහාසය ගොඩනැගේ.

ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී තොරතුරු ලබාගත හැකි මූලාශ්‍රය විශාල ප්‍රමාණයක් ඇති බැවින් ඒවා වර්ග දෙකකට වෙන් කෙරේ.

1. සාහිත්‍ය මූලාශ්‍රය

2. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය

අතීත ප්‍රජාව විසින් විවිධ කාල වකවානුවල ලියන ලද ග්‍රන්ථ හෝ ලේඛන සාහිත්‍ය මූලාශ්‍රය ලෙස සැලකේ. පුරාවිද්‍යා කැණීම් හා පර්යේෂණ මඟින් සොයා ගැනෙන පුරාවස්තු, ස්මාරක, කාසි, ශිලාලිපි හා විවිධ නටබුන් ආදිය පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ලෙස හැඳින්වේ. මීළඟට අපි ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට යොදගත හැකි මූලාශ්‍රය ඇසුරින් ඉහත කී වර්ග දෙක පිළිබඳ තවදුරටත් කරුණු විමසා බලමු.

### 1. සාහිත්‍ය මූලාශ්‍රය

ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට යොදගත හැකි සාහිත්‍ය මූලාශ්‍රය, දේශීය සාහිත්‍ය මූලාශ්‍රය හා විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය වශයෙන් වර්ග දෙකකට වෙන් කළ හැකි ය. අදින් වසර දෙදහසකට පමණ පෙර සිට ලාංකිකයන් විසින් ගද්‍ය හා පද්‍ය වශයෙන් වරින් වර ලියන ලද කෘති දේශීය සාහිත්‍ය මූලාශ්‍රය ලෙස සැලකේ. මෙසේ ලාංකිකයන් විසින් ම ශ්‍රී ලංකාව පිළිබඳ ලියන ලද ග්‍රන්ථවලට අමතරව මෙරට පිළිබඳ උනන්දුවක් දැක් වූ විදේශිකයන් විසින් ද යම් යම් කෘති රචනා කරන ලදී. නැතහොත් විදේශිකයන් ලියූ කෘතිවල ලංකාව පිළිබඳව ද තොරතුරු ඇතුළත් කර තිබේ. මෙසේ විදේශිකයන් විසින් මෙරට පිළිබඳ තොරතුරු සඳහන් කරමින් ලියන ලද කෘති විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය ලෙස හැඳින් වේ.

**දේශීය සාහිත්‍ය මූලාශ්‍රය**

ශ්‍රී ලංකාවේ දේශීය සාහිත්‍ය මූලාශ්‍රය අතර වඩාත් පැරණිත ම කෘතිය දීපවංසය ලෙස සැලකේ. දීපවංසය ක්‍රිස්තු වර්ෂ හතරවන සියවසේ දී පමණ රචනා කරන ලද කෘතියකි. මහසෙන් රාජ්‍ය සමය අවසානය තෙක් මෙරට ඓතිහාසික තොරතුරු හා ශාසන ඉතිහාසය සම්බන්ධ පුවත් දීපවංසයට ඇතුළත් වේ. එහෙත් ඇතැම් ඓතිහාසික පුවත් දීපවංසයේ දක්වා ඇත්තේ ඉතා කෙටියෙනි. පුනරුක්ති දෝෂ ද මෙම කෘතිය තුළ දක්නට ලැබේ. මේ නිසා දීපවංසය තිබිය දී ම අඩුපාඩු වඩා අඩු කෘතියක් වශයෙන් මහාවංසය රචනා කොට තිබේ.



*ඡායාරූපය 1.1 පුරාණ කාලයට අයත් සාහිත්‍යය ආගමික තොරතුරු හා වංසකථා ලියැවී තිබෙන්නේ පුස්කොළ පොත්වල ය. දීර්ඝ කාලයකට අයත් පුස්කොළ පොත් සම්ප්‍රදායක් ශ්‍රී ලංකාව සතුව තිබේ.*



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

මහාවංසය යනු කොටස් කිහිපයකින් යුතු කෘතියකි. එහි මුල් කොටස අනුරාධපුර දික්සඳ සෙනවියා පිරිවෙනේ විසූ මහානාම නම් භික්ෂූන් වහන්සේ කෙනෙක් විසින් රචනා කරන ලදී. දීපවංසයේ මෙන් බුදුන් වහන්සේගේ ලංකා ගමනයේ සිට මහසෙන් රාජ්‍ය සමය අවසානය තෙක් මෙරට ඓතිහාසික තොරතුරු මහාවංසයේ මුල් කොටසට ඇතුළත් වේ. එම කොටස ක්‍රිස්තු වර්ෂ පස්වන හෝ හයවන සියවසේ පමණ රචනා කොට ඇත. මහාවංසයේ මුල් කොටස හා දීපවංසයේ ඇතැම් තොරතුරු අතර සමානතාවක් දක්නට ලැබේ. මෙම මූලාශ්‍රය දෙක ම රචනා කිරීමේ දී ඊට ප්‍රථම ලිය වී තිබූ සීහලට්ඨකථා මහාවංසය, උත්තර විහාරට්ඨ කථා, විනයට්ඨ කථා ආදි මුල් ග්‍රන්ථවල ආභාසය ලැබී තිබීම ඊට හේතු වන්නට ඇත.

| මූලාශ්‍රය වර්ගය | උදාහරණ |
|---|---|
| සන්දේශ කාව්‍ය | මයූර සන්දේශය, තිසර සන්දේශය, සැලළිහිණි සන්දේශය |
| ප්‍රශස්ති කාව්‍යය | පැරකුම්බා සිරිත |
| හටන් කාව්‍ය | සීතාවක හටන, කොන්ස්තන්තිනූ හටන, ඉංග්‍රීසි හටන |

*වගුව අංක 1.1 එකිනෙකට වෙනස් අන්තර්ගතයකින් යුත් පැරණි සාහිත්‍ය මූලාශ්‍රය කිහිපයක්.*

මහානාම හිමියන් මහාවංසයේ මුල් කොටස ලිවීමෙන් පසු වෙනත් කතුවරුන් විසින් වරින් වර ඒ ඒ කාලවකවානු පිළිබඳ තොරතුරු ඇතුළත් කොට අඛණ්ඩ කෘතියක් වශයෙන් මහාවංසය තවත් කොටස් කිහිපයක් වශයෙන් දීර්ඝ කරන ලදී. මේ නිසා ශ්‍රී ලංකාවේ ඉතිහාසය මහාවංසය තුළ අඛණ්ඩව ලිය වී තිබේ. රටක ඉතිහාසය අඛණ්ඩව එකම කෘතියක ලිය වී ඇති රටවල් සංඛ්‍යාව සීමිත බැවින් මෙරට ඉතිහාසය එක ම කෘතියක සඳහන්ව තිබීම ලාංකිකයන්ට ආඩම්බර විය හැකි කරුණකි. මහාවංසයේ සඳහන් ඇතැම් ඓතිහාසික සිදුවීම් ශිලාලිපි හා වෙනත් මූලාශ්‍රය මගින් තහවුරු වන බැවින් එය වඩා විශ්වසනීය මූලාශ්‍රයක් ලෙස සැලකේ.

මහාවංසයේ මුල් කොටස ලිය වී ශතවර්ෂ හතරකට පමණ පසු පාලි භාෂාවෙන් රචිත එම කෘතියේ ඇතැම් තැන් තවත් විස්තර කොට අර්ථ විවරණය සඳහා ටීකාවක් සම්පාදනය කෙරිණි. මහාවංස ටීකාව ලෙස හඳුන්වන එම කෘතිය වංසත්ථප්පකාසිනී යනුවෙන් නම් කර ඇත. වෙනත් මූලාශ්‍රයවලින් නොලැබෙන තොරතුරු රැසක් එම ග්‍රන්ථයට ඇතුළත්ව තිබේ.

මෙරට ඉතිහාසයේ අනුරාධපුර යුගයේ සිට මහනුවර රාජ්‍ය සමය දක්වා කාලපරිච්ඡේදය තුළ දේශීය සාහිත්‍යකෘති ලෙස සැලකිය හැකි තවත් ග්‍රන්ථ රැසක් රචනා වී ඇත. ධර්ම ග්‍රන්ථ ලෙස සැලකිය හැකි බෝධිවංසය, ථූපවංසය, ධාතුවංසය, පූජාවලිය, සද්ධර්මාලංකාරය, වැනි කෘති රජරට ශිෂ්ටාචාර සමයේ ඉතිහාසය හැදෑරීමට වැදගත් වේ. මෙරට ශාසන ඉතිහාසය පිළිබඳ ලියවී ඇති නිකාය සංග්‍රහය, දේශපාලන තොරතුරු ඇතුළත් රාජාවලිය වැනි කෘති ගම්පොළ රාජ්‍ය සමයේ සිට කෝට්ටේ රාජ්‍ය කාලය දක්වා ඉතිහාසය හැදෑරීමේ වැදගත් මූලාශ්‍රය වේ. කෝට්ටේ රාජ්‍ය කාලයේ සිට මහනුවර රාජ්‍ය සමය දක්වා ඉතිහාසය හැදෑරීමේ දී සංදේශ කාව්‍ය, ප්‍රශස්ති කාව්‍ය හා හටන් කාව්‍ය ආදිය ද වැදගත් ය. වගු අංක 1.1 හි මෙබඳු මූලාශ්‍රයවලට අයත් උදාහරණ කිහිපයක් දැක්වේ.

දේශීය සාහිත්‍ය කෘති විවිධ කාල වකවානුවල රචනා වූ ඒවා වන අතර ඒ ඒ කෘති රචනා කිරීමට බලපෑ හේතු ද විවිධ වේ. අනුරාධපුර යුගයේ සිට කෝට්ටේ රාජ්‍ය සමය ආරම්භ වන තෙක් කාලයේ ලිය වී ඇති බොහොමයක් කෘති ආගමික අරමුණුවලින් රචනා වූ ඒවා වේ. ඇතැම් සාහිත්‍ය කෘති රචනා වූයේ ඒවායේ සඳහන් ඓතිහාසික සිදුවීම්වලින් ශතවර්ෂ කිහිපයකට පසුව ය. මේ නිසා ඉතිහාසය ගොඩනැඟීමට සාහිත්‍ය මූලාශ්‍රය යොදා ගැනීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිල්ල යොමු කළ යුතු වේ.

1. මූලාශ්‍රය රචනා වූ කාලය.
2. මූලාශ්‍රයේ කතුවරයා.
3. කතුවරයාගේ අරමුණු.
4. මූලාශ්‍රයට කරුණු සපයාගත් ආකාරය.

මේ අනුව සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනයේ දී විචාර බුද්ධියෙන් කටයුතු කළ යුතු බව ඔබට වැටහෙනවා ඇත-

### විදේශීය මූලාශ්‍රය

අනුරාධපුර යුගයේ මුල්භාගයේ සිට ම ශ්‍රී ලංකාව විදේශ රටවල් සමඟ වෙළෙඳ සබඳතා පැවැත් වූ බැවින් ඉන්දියානු සාගරයේ වෙළෙඳ කටයුතුවල නිරත වූ බොහෝ විදේශිකයෝ මෙරට පිළිබඳ දැන සිටියහ. මේ නිසා ක්‍රිස්තු පූර්ව අවධියේ පවා විදේශිකයන් ලියූ ඇතැම් කෘතිවල ශ්‍රී ලංකාව පිළිබඳ යම් යම් තොරතුරු ඇතුළත් කර තිබේ. ඈත අතීතයේ සිට ම ලංකාව හා ඉන්දියාව අතර හොඳ සබඳතාවක් පැවතුණි. මේ නිසා ඉන්දියාවේ ඇතැම් මූලාශ්‍රයවල ද ලංකාව පිළිබඳ තොරතුරු සඳහන් වේ. දකුණු ඉන්දියාවේ දී රචිත සිලප්පාදිකාරම්, මණිමේකලයි, පදිර්රුපත්තු වැනි දෙමළ ග්‍රන්ථවල ද ලංකාව ගැන තොරතුරු දක්නට ලැබේ. ක්‍රිස්තු වර්ෂ 16 වන සියවසේ දී පෘතුගීසින් මෙරටට පැමිණීමෙන් පසුව ශ්‍රී ලංකාව පිළිබඳ වෙන ම තොරතුරු ඇතුළත් ග්‍රන්ථ පවා රචනා කිරීමට ඇතැම් විදේශිකයෝ පෙලඹුණහ. ශ්‍රී ලංකාව ගැන සඳහන් විදේශීය මූලාශ්‍රය දෙස බලන විට ලංකාවට නොපැමිණි වෙනත් අයගෙන් අසා දැනගත් තොරතුරු පදනම් කරගෙන මෙරට ගැන ලියූ ලේඛකයන් මෙන් ම ලංකාවට පැමිණ තොරතුරු අධ්‍යයනය කර ලියූ ලේඛකයන් ද සිටින බව පෙනේ.



*ඡායාරූපය 1-2 ග්‍රීකරෝමානුවෙකු වූ ක්ලෝඩියස් ටොලමි ක්‍රිස්තු වර්ෂයෙන් 90168 අතර කාලයේ ඇලෙක්සැන්ඩ්‍රියාවේ ජීවත් වූ භූගෝල ශාස්ත්‍රඥයෙකි. ඔහු විසින් ශ්‍රී ලංකාවේ සිතියමක් ඇඳ තිබේ.*

චිත්‍ර මූර්ති හා පුරාවස්තු වශයෙන් වර්ග කිහිපයකට බෙදා දැක්විය හැකි ය.

| | |
|---|---|
| චීන මූලාශ්‍රය | පාහියන් හිමියන්ගේ දේශාටන වාර්තාව (බෞද්ධ රාජධානි පිළිබඳ විස්තරය) |
| අරාබි මූලාශ්‍රය | ඉබන් බතූතාගේ දේශාටන වාර්තාව |
| පෘතුගීසි මූලාශ්‍රය | රිබෙයිරෝගේ ලංකාව පිළිබඳ ග්‍රන්ථය (රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය) |
| ඕලන්ද මූලාශ්‍රය | පිලිප්පස් බැල්ඩියස්ගේ කෘතිය (බැල්ඩියස්ගේ ලංකා පුරාවෘත්තය) |
| ඉංග්‍රීසි මූලාශ්‍රය | රොබට් නොක්ස්ගේ කෘතිය (එදා හෙළදිව) |

*වගුව අංක 1.2 ශ්‍රී ලංකාවට පැමිණ මෙහි ඇති තතු දැකබලා ඒ පිළිබඳව තබන ලද වාර්තා සහ ඒවායේ කර්තෘවරු.*

### සාහිත්‍ය මූලාශ්‍රයවල ප්‍රයෝජන

1. ඓතිහාසික කාල අනුපිළිවෙළ සකස් කර ගැනීමට

2. එක් එක් අවධිවල දේශපාලන, ආර්ථික සමාජ සංස්කෘතික කටයුතු පිළිබඳ තොරතුරු ලබා ගැනීමට

3 එක් මූලාශ්‍රයක් මඟින් ලැබෙන තොරතුරු තවත් මූලාශ්‍රයක් මඟින් සනාථ කර ගැනීමට

4 රටක විදේශීය සබඳතා අධ්‍යයනය කිරීමට (විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය මෙහි දී විශේෂයෙන් වැදගත් වේ)

### 2. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය

පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය, අභිලේඛන, කාසි, නටබුන්,

### අභිලේඛන

අභිලේඛන යනු ගල් (ශිලා), මැටිපුවරු, බිත්ති, තඹ තහඩු, රන් තහඩු, දැව හා විවිධ භාජන ආදියෙහි ලියා ඇති පැරණි ලේඛන පොදුවේ හැඳින්වීමට යොදන පදයකි. ගල් මත ලියා ඇති ලේඛන හැඳින්වීමට ශිලාලේඛන හෝ සෙල්ලිපි යන නාමය යෙදේ.

### සෙල්ලිපි

ශිලාලිපි හෙවත් සෙල්ලිපි ලියා ඇති ගල්වල ස්වරූපය අනුව ඒවා ලෙන්ලිපි, ගිරිලිපි, ටැම්ලිපි, පුවරුලිපි, හා ආසන ලිපි ආදි වශයෙන් වර්ග කළ හැකි ය. මෙරට පැරණිතම ශිලා ලිපි බ්‍රාහ්මී ලිපි ලෙස හඳුන්වන අතර ප්‍රධාන වශයෙන් භික්ෂූන්ට ලෙන් පිදීම වැනි දේ වාර්තා කර තැබීමට එම ලිපි ලියා තිබේ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

| මූලාශ්‍රය වර්ගය | උදාහරණ |
|---|---|
| ග්‍රීක මූලාශ්‍රය | ඇරිස්ටෝටල්ගේ ඩිමුණ්ඩො කෘතිය, මෙගස්තිනිස්ගේ ඉන්ඩිකා කෘතිය, ඔනෙසික්‍රිටස්ගේ වාර්තා |
| රෝම මූලාශ්‍රය | ප්ලිනීගේ නැචුරලිස් හිස්ටෝරියා කෘතිය, ටොලමිගේ භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය කෘතිය, ටොලමිගේ ලංකා සිතියම |
| චීන මූලාශ්‍රය | හියුං සියැං භික්ෂුවගේ දේශාටන වාර්තා කෘතිය |
| පෘතුගීසි මූලාශ්‍රය | ෆර්නාඕ ඩී ක්වෙරෝස් පියතුමාගේ ලංකාව පිළිබඳ ග්‍රන්ථය |

*වගුව අංක 1.3 තමන් විසින් නුදුටු එහෙත් වෙනත් අය විසින් පවසන ලද තොරතුරු මත පිහිටා ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තා තැබූ කර්තෘවරුන් සහ ඔවුන්ගේ කෘති.*


පැරණි සමාජ ඉතිහාසය හා ජනාවාස ව්‍යාප්තිය තේරුම් ගැනීමට මෙම ලිපි වැදගත් වේ- ක්‍රිස්තු පූර්ව දෙවන සියවසේ සිට මහනුවර රාජ්‍ය සමය දක්වා ශිලාලිපි ලිවීම අඛණ්ඩව පැවතුණි- ක්‍රිස්තු වර්ෂ දෙවන සියවසෙන් පසුව විහාරාරාමවලට ගම්බිම් පිදීම විහාරාරාම පාලනය, රජයේ නීති මහජනයාට දැනුම් දීම, බදු අයකිරීම, වෙළෙඳාම, වැරදිකරුවන්ට සමාව දීම පුද්ගලයන්ගේ සේවය ඇගයීම වැනි නොයෙක් කරුණු වාර්තා කර තැබීමට ශිලාලිපි පිහිටුවනු ලැබීය. මේ නිසා සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් නොවන බොහෙ ා් කරුණු ශිලාලිපිවලින් අනාවරණය කර ගත හැකි ය.

### කාසි

අනුරාධපුර යුගයේ සිට ලංකාවේ කාසි භාවිතය පැවතුණි. මෙරටින් හමුවන පැරණිතම කාසි 'කහාපණ' ලෙස හැඳින්වේ. පුරාණ හෝ ධරණ යන නම් ද එම කාසිවලට යෙදේ. ඇතා සහ ස්වස්තික කාසි, ලක්ෂ්මී කාසි හා අක නම් රන් කාසි වර්ගයක් ද මෙරට භාවිත කර ඇත. පොළොන්නරු රාජ්‍ය සමයේ තඹ මස්ස කාසි භාවිත කෙරිණි. මෙරටට අවශ්‍ය කාසි රට තුළ ම නිෂ්පාදනය කර ඇති අතර කාසි නිපද වූ අච්චු පවා කැණීම්වලින් හමු වී තිබේ. දේශීය කාසිවලට අමතරව රෝම කාසි, චීන කාසී. ඉන්දියානු කාසි ආදියත් ශ්‍රී ලංකාවෙන් හමු වේ. රටේ ආර්ථික තත්ත්වය, වෙළෙඳම, ලෝහ භාවිතය ආදිය හැදෑරීමේ දී කාසි ඉතා වැදගත් මූලාශ්‍රයකි. පැරණි කාසි පිළිබඳව හදාරන විෂය නාණක විද්‍යාව ලෙස හැඳින්වේ.

### පුරාණ නටබුන්

ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල පැරණි ගොඩනැගිලි, දාගැබ්, ගල් කණු, වැව්, පොකුණු, ආදි නටබුන් දක්නට ලැබේ- අතීතයේ මෙරට ජනතාව ජීවත් වූ ඇතැම් ස්ථාන තවමත් වනගතව පවතින බැවින් වනාන්තර ආශ්‍රිතව වුව ද මෙබදු නටබුන් පවතී. ඓතිහාසික ස්ථාන හෝ පුරාවිද්‍යාත්මක ස්මාරක ලෙස හඳුන්වන මෙකී නටබුන් මෙරට ඉතිහාසය හැදෑරීමේ හොඳ මූලාශ්‍රයකි. පැරණි ජනතාවගේ නිර්මාණාත්මක හැකියාව, තාක්ෂණය, ගොඩනැගිලි නිර්මාණය, හෙවත් වාස්තුවිද්‍යාව,



*ඡායාරූපය අංක 1.3 කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමා විසින් කරවන ලද ගල්පොත සෙල්ලිපිය. මෙය පිහිටා තිබෙන්නේ පොළොන්නරුවේ ය.*



*ඡායාරූපය අංක 1.4 පළමුවන විජයබාහු රජතුමා විසින් ලියවන ලද පනාකඩුව තඹ සන්නස. මෙය තමාට පක්ෂපාතිත්වය දැක්වූ සිත්නාරුබිම බුදල්නා නම් නිලධාරියාට කළගුණ සලකනු පිණිස ඔහුට පිරිනමන ලද්දකි. මෙහි පළමුවන පේළියේ සිට තෙවන පේළිය දක්වා ''**ස්වස්ති සිරිසිරිවත් අපිරියත් ලෝ ඉකුත් ගුණමුලින් උතුරත් මුළු දඹදිව්හි අන්කැත්කුල පාම්ලි කළ ඔකාවස් රද් පරපුරෙන් බට් කැත් උසබ්නට් අගමෙහෙසුන් වූ ලක්දිව් පොළො යොහෙන පරපුරෙන් හිමි සිරිසගබෝ විජයබාහු රජපා වහන්සේ**'' යනුවෙන් ලියා තිබේ- ක්‍රිස්තු වර්ෂයෙන් දෙළොස්වන සියවසේ ඉතිහාසය හැදෑරීමට මෙම ලේඛනය වැදගත් මූලාශ්‍රයකි-*

| **අභිලේඛන ලියා ඇති මාධ්‍ය** | **උදහරණ** |
|---|---|
| ශිලාලිපි | නිශ්ශංකමල්ල රජුගේ ගල්පොත ලිපිය |
| බිත්ති | සීගිරි ගී |
| තඹ තහඩු | පළමුවන විජයබාහු රජුගේ පනාකඩුව තඹ සන්නස |
| රන් තහඩු | වල්ලිපුරම් රන්පත |
| දැව | ඇම්බැක්කේ දේවාලයේ දැව කණුවල ලියූ ලේඛන |
| මැටි පුවරු | උළු හා ගඩොල් මත ලියූ අකුරු |
| භාජන | මැටි වළං, පාත්‍ර ආදියේ ලියූ අකුරු |

*වගුව අංක 1.4 අභිලේඛන ලියා ඇති එකිනෙකට වෙනස් මාධ්‍ය කිහිපයක්.*

| | |
|---|---|
| ලෙන් ලිපි | ගල්ලෙන්වල කටාරම අසල ලියූ ලිපි |
| ගිරිලිපි | ගල් තලාවල හෝ ගල්කුළුමත ලියූ ලිපි |
| ටැම්ලිපි | සකස්කර ගත් ගල්කුලුණු මත ලියූ ලිපි |
| පුවරුලිපි | සකස්කර ගත් ගල්පුවරු මත ලියූ ලිපි |
| ආසනලිපි | මල් ආසන මෙන් තැබූ ගල්පුවරු මත ලියූ ලිපි |

වගුව අංක 1.5 ලියා තිබෙන ස්ථානයේ ස්වරූපය පදනම් කරගෙන අභිලේඛන හැඳින්වීම සඳහා යොදන ව්‍යවහාර

සීගිරි චිත්‍ර උදහරණයක් වශයෙන් ගත හොත් පැරණි කාන්තාවන්ගේ ඇඳුම් පැළඳුම්, ආභරණ, කොණ්ඩ මෝස්තර, රූපලාවණ්‍ය කටයුතු වැනි අංශ කිහිපයක් ගැන එමගින් තොරතුරු ලබා ගත හැකිය.

ශිල්පීය දක්ෂතාව, පරිසර සංරක්ෂණ හැකියාව, ජල පාලනය වැනි විවිධ අංශ පිළිබඳ නිරවුල් දැනුමක් ලබා ගැනීමට මෙම නටබුන් අපට උපකාරී වේ.

## චිත්‍ර මූර්ති හා පුරාවස්තු

පැරණි චිත්‍ර, මූර්ති හා කැටයම් ආදිය අපේ සංස්කෘතික ඉතිහාසය පෙන්නුම් කෙරෙන ජීවමාන සාක්ෂි වේ. අතීත ජනතාවගේ ඇඳුම් පැළඳුම්, කලා කුසලතාව, ආභරණ පරිහරණය, වර්ණ භාවිතය, ආගමික විශ්වාස, ආදි බොහෝ අංශ පිළිබඳ තොරතුරු ලබා ගැනීමට චිත්‍ර, මූර්ති හා කැටයම් උපකාරී වේ-

පැරණි ජනතාව විසින් නිර්මාණය කරන ලද හෝ පරිහරණය කරන ලද දැනට ඉතිරිව ඇති දේ පුරාවස්තු ලෙස හැඳින්විය හැකි ය. මෙරට කෞතුකාගාරවල, ආගමික ස්ථානවල, විවිධ ආයතන හෝ පුද්ගලයන් භාරයේ පුරාවස්තු පවතී. කැණීම් මඟින් ද බහුලව පුරාවස්තු හමු වේ. පැරණි ජනතාවගේ විවිධ හැකියා, කුසලතා, පැරණි සංස්කෘතිය, තාක්ෂණය, විදේශ සබඳතා හා ඔවුන්ගේ ජීවන ක්‍රමය ආදි අංශ රැසක් පිළිබඳ අවබෝධය ලබා ගැනීමට පුරා වස්තු උපකාරී වේ.



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*



*ඡායාරූපය අංක 1.5 ශ්‍රී ලංකාවේ භාවිත වූ මෙම කාසිය රනින් නිමවන ලද්දකි. එය හැඳින්වෙන්නේ මධ්‍යකාලීන රන් කහවණුව නමිනි- මෙවැනි කාසි පුරාණ කාලයේ ආර්ථිකය පමණක් නොව තාක්ෂණය හැදෑරීමට ද ඉවහල් වන මූලාශ්‍රයකි.*

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ගොඩනැඟීමට යොදා ගත හැකි විවිධ මූලාශ්‍රය රාශියක් තිබෙන බව ඉහත සඳහන් කරුණුවලින් ඔබට පෙනී යනු ඇත. මූලාශ්‍රය ඇසුරින් තොරතුරු ලබාගෙන ඉතිහාසය ගොඩනැගීමේ දී අතීතය නිවැරදිව දැකීමට නම් එම මූලාශ්‍රය විචාර බුද්ධියෙන් යුතුව පරිශීලනය කළ යුතු වේ. සාහිත්‍ය මූලාශ්‍රය බොහෝ විට ඓතිහාසික සිදුවීම්වලට වඩා පසුකාලීන වාර්තා ය. එසේ ම එම ග්‍රන්ථවල කර්තෘවරුන්ගේ රුචිඅරුචිකම් මූලාශ්‍රයවලට ඇතුළු විය හැකි ය. පුරාවිද්‍යා මූලාශ්‍රය බොහෝ විට ඓතිහාසික සිදුවීම්වලට සමකාලීන ඒවා ලෙස සැලකේ. මේ අනුව සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් තොරතුරු පුරාවිද්‍යාත්මක වශයෙන් සනාථ වේ නම් ඒවා වඩා විශ්වාසදායි තොරතුරු ලෙස සැලකිය හැකි ය. කිසියම් ඓතිහාසික සිදුවීමක් පිළිබඳ ඉතිහාසය ගොඩනැගීමේ දී ඊට අදාළ ව සපයාගත හැකි සියලු මූලාශ්‍රය පරිශීලනය කළ යුතු ය. එහි දී ලැබෙන විවිධ තොරතුරු විචාරත්මකව හදරා වඩා විශ්වාසදායි තොරතුරු තෝරා බේරා ගෙන අදාළ සිදුවීමේ ඉතිහාසය ගොඩනැගිය යුතු ය. මේ අනුව සාහිත්‍ය මූලාශ්‍රයවල අඩු පාඩු පුරවා ගැනීමට මෙන් ම අලුත් තොරතුරු ලබා ගැනීමට ද, සාහිත්‍ය කෘතිවල සඳහන් කරුණු සනාථ කර ගැනීමට ද පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ප්‍රයෝජනවත් වේ.



*ඡායාරූපය අංක 1.6 අනුරාධපුරයේ ඉසුරුමුණි විහාරයේ පිහිටි අශ්වහිස සහ මිනිසා දක්වෙන මූර්තිය. ක්‍රිස්තු වර්ෂයෙන් හත්වන සියවසේ දී නිර්මාණය කරන්නට ඇතැයි සැලකෙන මෙම මූර්තිකර්මයෙන් අග්නි (අශ්ව හිස) හා පර්ජන්‍ය (මිනිස් රූපය) යන දෙවිවරුන් නිරූපිතයැ යි විශ්වාස කෙරේ.*

## 1.2 ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම

ඉතිහාසය යනු මූලාශ්‍රය අධ්‍යයනය සමග බැඳී ඇති විෂයක් මෙන් ම කුතුහලයෙන් යුතුව හැදෑරිය හැකි විෂයකි. මේ නිසා ඉතිහාසය හදරන්නා ස්වභාවයෙන් ම පොත්පත් කියවීමට පෙලඹෙයි. පොත්පත් කියවීමේ දී ඓතිහාසික සිදුවීම් පිළිබඳ විවිධ කරුණු, අදහස්, හා මතවාද හමුවන බැවින් කියවන්නා තුළ විචාර බුද්ධිය දියුණු වේ. මේ නිසා ඔහු සෑම දෙයක් පිළිබඳව ම තර්කානුකූලව සිතීමට පෙලඹෙන අතර එමගින් ගැටලු නිසි පරිදි තේරුම් ගැනීමට ද හැකියාව ලබයි. ගැටලු නිසි පරිදි තේරුම් ගත් විට ඒවාට නිර්මාණාත්මක පිළිතුරු සෙවීමට පෙලඹීමක් ඇති කරයි. මේ නිසා ඉතිහාසය ඉගෙනීමෙන් කෙනෙකුගේ පෞරුෂත්වය වර්ධනය වේ. මීට අමතරව ඉතිහාසය ඉගෙන ගැනීමෙන් පහත සඳහන් ප්‍රයෝජන අත් වේ.

1. තමා ජීවත් වන සමාජය හා ලෝකය පිළිබඳ යථාවබෝධය

2. අතීත අත්දැකීම් මඟින් වර්තමානය තේරුම් ගෙන අනාගතය ගොඩනැගීම

3. රටේ ජාතික අනන්‍යතාව හඳුනා ගැනීම

4. මනුෂ්‍යත්වයට ආදරය කිරීමෙන් ජාතික සමගිය ගොඩනැගීම

5. අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීමට පුරුදු වීම

6. විවිධ මත ඉවසීමට හුරු වීම

## 1.3 පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ආරක්ෂා කර ගැනීම

ශ්‍රී ලංකාවට හිමි දීර්ඝ ඉතිහාසයත්, අතීත ජනගහන ව්‍යාප්තියත්, ශතවර්ෂ ගණනාවක් තුළ මෙරට ජීවත් වූ ජන සංඛ්‍යාවත් දෙස බලන විට පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වශයෙන් අද අපට ඉතිරිව ඇත්තේ ගල්, ලෝහ, හෝ පිළිස්සූ මැටි වැනි කල් පවතිනා අමුද්‍රව්‍යවලින් කළ නිර්මාණ පමණකි. නැතහොත් වැව්අමුණු වැනි මහා පරිමාණ නිර්මාණ වේ. රට තුළ සිදුවන ශීඝ්‍ර නාගරීකරණය, ජනාවාස ව්‍යාප්තිය, මංමාවත් තැනවීම, ගොඩනැගිලි ඉදිකිරීම, කෘෂිකාර්මික කටයුතු ආදිය නිසා ඇතැම් විට මෙම වටිනා මූලාශ්‍රය විනාශ වන අවස්ථා තිබේ. ඓතිහාසික ස්ථාන, ස්මාරක හා පුරාවස්තු අද අපට දක්නට ලැබෙනුයේ අපේ අතීත පරම්පරාව ඒවා ආරක්ෂා කළ නිසා ය. එබැවින් වර්තමාන පරම්පරාව වශයෙන් ඒවා ආරක්ෂා කිරීම රටේ සියලු පුරවැසියන් සතු වගකීමකි.

ශ්‍රී ලංකාවේ නොයෙක් ප්‍රදේශවල ගල්වල කොටා ඇති විවිධ පැරණි සලකුණු දක්නට ලැබේ. එසේ දක්නට ලැබෙන ඉර හඳ රූප, වටාපොත, දුන්න, ඊතලය, හක්ගෙඩිය, ගොන්කුරය, ඇත් අඩිය හා විවිධ සත්ත්ව රූප ආදිය පැරණි ප්‍රදේශීය මායිම් පෙන්වන රූප සටහන් වේ. නැතහොත් වර්තමාන මාර්ග සලකුණු මෙන් ඒවා ද පැරණි සන්නිවේදන ක්‍රමයකි. මෙවැනි සලකුණු හා සඳකඩපහණ, මුරගල්, ගල්කණු හෝ පුරාවස්තු ඇති වෙනත් ස්ථානවල වටිනා දේ තැන්පත්ව ඇතැයි වරදවා සිතන ඇතැම්හු නොදැනුවත්කම නිසා මෙබඳු තැන් හාරා විනාශ කරති. ඓතිහාසික ස්ථානවල හෝ පුරා වස්තු මත අකුරු ලිවීම, රූප ඇඳීම ආදියත් පුරා වස්තු විනාශයට හේතු වන අතර රටේ නීතිය අනුව ද එය දඬුවම් ලැබෙන වරදකි. එබැවින් පුරාවිද්‍යා මූලාශ්‍රයවලින් සිදුවන මෙහෙය වටහාගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් වශයෙන් ඒවා ආරක්ෂා කිරීමට ඔබ අධිෂ්ඨාන කර ගත යුතු ය.

**වැදගත් කරුණු**

1. ඉතිහාසය හැදෑරීමට ඉවහල් වන දෑ හැඳින්වෙන්නේ මූලාශ්‍රය යනුවෙනි.

2. මූලාශ්‍රය සාහිත්‍ය සහ පුරාවිද්‍යාත්මක යනුවෙන් කොටස් දෙකකට බෙදිය හැකි ය.

3. පැරණි කාලයේ රචනා කරන ලද පොත්පත් ආදිය සාහිත්‍ය මූලාශ්‍රය ගණයට අයත් වන අතර නටබුන් වී තිබෙන ගොඩනැගිලි, නොයෙකුත් පුරාවස්තු ආදි දෑ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ය.

4. ඉතිහාසය ඉගෙන ගැනීමෙන් පැරණි කාලයේ ජීවත් වූ අපේ මුතුන්මිත්තන් විවිධ අත්දැකීම්වලට මුහුණ දුන් ආකාරය වටහා ගැනීමට හැකි වේ. එමගින් ඒ හා සමාන වර්තමාන ගැටලුවලට මුහුණ දීමට අවශ්‍ය කරන දැනුම ලබා ගැනීමට අවකාශයක් සැලසේ.

5. රටක ඉතිහාසය එම රටේ ජීවත් වන පුරවැසියන්ගේ අනන්‍යතාව පිළිබිඹු කරයි.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

**ක්‍රියාකාරකම**

1. මෙම පාඩමේ දී ඔබ විසින් ඉගෙන ගනු ලැබූ විවිධ මූලාශ්‍රය පහත සටහනේ දැක්වෙන ආකාරයට පෙළ ගස්වන්න.

| මූලාශ්‍රය | මූලාශ්‍රය වර්ගය<br>සාහිත්‍ය/ පුරා විද්‍යාත්මක | ඉතිහාසය ගොඩනැගීමට<br>ලැබෙන ප්‍රයෝජන |
|---|---|---|
| (i) දීපවංසය<br>(ii) මහාවංසය<br>(iii) එදා හෙළ දිව<br>(iv) පැරකුම්බා සිරිත<br>(v) සීගිරිය<br>(vi) සීතාවක හටන<br>(vii) පනාකඩුව තඹ සන්නස<br>(viii) ටොලමිගේ ලංකා සිතියම<br>(ix) වල්ලිපුරම් රන් සන්නස<br>(x) වී.ඕ.සී.කාසි | | |

2. "ඉතිහාසය ඉගෙනීමෙන් මගේ ජීවිතයට ගතහැකි ආදර්ශ" යන මැයෙන් පුවත් පතකට ලිපියක් සකස් කරන්න.

*දික්සඳ සෙනවියා පිරිවෙන අනුරාධපුර මහාවිහාරයට අනුබද්ධව පිරිවෙන් කිහිපයක් තිබිණි. සුන්හාත පිරිවෙන, මරුගන පිරිවෙන, එලග්ග පිරිවෙන යනු ඒ අතරින් කිහිපයකි. දික්සඳ සෙනවියා පිරිවෙන යනු ඒ පිරිවෙන් මඩුල්ලට අයත්ව තිබූ තවත් පිරිවෙනකි. මහාවංසය රචනා කළ මහානාම හිමියන් ඒ පිරිවෙනේ වැඩ වාසය කළ හිමිනමකි.*

*ෆාහියන් හිමි ෆාහියන් (FA-HSIEN) යනු චීන ජාතික භික්ෂූන්වහන්සේ නමකි. උන්වහන්සේ බෞද්ධධර්මය ඇතුළත් පොත්පත් සොයා චීනයේ සිට පයින් ම ඉන්දියාවට පැමිණියේ ය. ෆාහියන් භික්ෂූන්වහන්සේ (ක්‍රි.ව. 399414) ක්‍රිස්තු වර්ෂයෙන් පස්වන සියවසේ දී ශ්‍රී ලංකාවට වැඩම කොට දෙවසරක් අනුරාධපුර අභයගිරි විහාරයේ වැඩ වාසය කළ හ. උන්වහන්සේ චීනයේ ෂන්සි පළාතේ වුයැන්ග් නම් ගමේ උපත ලැබීය. උන්වහන්සේ විසින් රචිත ගමන් විස්තරවල එකල ශ්‍රී ලංකාවේ පැවති ඇතැම් දේ පිළිබඳව ද සඳහන් ය.*

*හියුං සියැං (Hsuan-Tsang) හියුං සියැං (ක්‍රි. ව. 602664) චීන ජාතික භික්ෂූන්වහන්සේ නමකි. උන්වහන්සේ වන්දනා කටයුතු සඳහා ඉන්දියාවට වැඩම කළහ. ක්‍රිස්තු වර්ෂයෙන් 629 දී චීනයෙන් නික්ම ආ උන්වහන්සේ වසර දහසයක් තිස්සේ සිය වන්දනා ගමනේ නිරත වූහ. ඒ අතර වාරයේ උන්වහන්සේ විසින් ආසියාවේ දී තමන් දුටු දේ වාර්තා කර තැබීය. ශ්‍රී ලංකාවට වැඩම නොකළ ද උන්වහන්සේ ඉන්දියාවේදී ශ්‍රී ලංකාව පිළිබඳ තමන්ට අසන්නට ලැබුනු දේ ලියා තැබීය. එම තොරතුරු වුව ද ක්‍රිස්තු වර්ෂයෙන් හත්වන සියවසේ මෙරට ඉතිහාසය හැදෑරීමට වැදගත් වේ*

*රිබෙයිරෝ ජොආඕ රිබෙයිරෝ (Joao Ribeiro) පෘතුගීසි ජාතිකයෙකි. 1640 මාර්තු මාසයේදී ඔහු ශ්‍රී ලංකාවට පැමිණියේ පෘතුගීසි හමුදාවට සේවය කරනු පිණිස ය. හෙතෙම අවුරුදු දහඅටක් තිස්සේ ශ්‍රී ලංකාවේ වාසය කරමින් පෘතුගීසි හමුදාවට සේවය කරමින් සිට කපිතාන්වරයෙකු දක්වා උසස් වීම් හිමි කර ගත්තේය. සිය වයෝවෘද්ධ කාලයේ පෘතුගාලයේ ලිස්බන් නුවර වාසය කරමින් ශ්‍රී ලංකාවේදී තමන් ලද අත්දැකීම් පදනම් කරගෙන පොත් කිහිපයක් රචනා කළේය. එම පොත් ක්‍රිස්තු වර්ෂයෙන් දහහත්වන සියවසේ ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට බෙහෙවින් ප්‍රයෝජනවත් ය.*

*පිලිප්පුස් බැල්දියස් (ක්‍රි.ව. 16321672) පිලිප්පුස් බැල්දියස් (Philippus Baldaeus) ලන්දේසි ජාතික දේවගැතිවරයෙකි. ඔහු ලන්දේසි හමුදා සමග ශ්‍රී ලංකාවට පැමිණියේය. ලන්දේසීන්ගේ පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගමට සේවය කිරීම ඔහුගේ රාජකාරිය විය. තම රාජකාරියට අමතරව ඔහු එවක ශ්‍රී ලංකාවේ පැවති සමාජ ජීවිතය, භාෂාව සහ සංස්කෘතිය පිළිබඳ වාර්තා තැබීය. එම වාර්තා ලන්දේසි සහ ජර්මානු භාෂාවෙන් ප්‍රකාශයට පත් කර තිබේ. බැල්දියස්ගේ වාර්තා ක්‍රිස්තුවර්ෂයෙන් දහහත්වන සියවසේ ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට බෙහෙවින් වැදගත් වන මූලාශ්‍රයකි.*

*රොබර්ට් නොක්ස් (Robert Knox) රොබර්ට් නොක්ස් (ක්‍රි.ව. 16411720) යනු ඉංග්‍රීසි ජාතික නැව්කපිතාන්වරයෙකි. ඔහු තම වසය 14 දී සිය පියා සමග නැව් නැගී ඉන්දියාවට පැමිණීයේය. ක්‍රිස්තු වර්ෂ 1658 දී පර්සියාව බලා යාත්‍රා කරමින් සිටි ඔවුන්ගේ නැවේ කුඹගස කුණාටුවක් නිසා බිඳී යාමේ හේතුවෙන් ක්‍රිස්තු වර්ෂ 1659 නොවැම්බර් 19 වන දා ශ්‍රී ලංකාවට පා වී ආවේය. ඒ අවස්ථාවේ දී රොබර්ට් නොක්ස් ඇතුළු නැවේ සිටි දහසය දෙනෙකුගෙන් සමන්විත පිරිස දෙවන රාජසිංහ රජු විසින් සිරභාරයට ගන්නා ලදී. අවුරුදු දහනවයක කාලයක් තිස්සේ සිරකරුවකු ලෙස ශ්‍රී ලංකාවේ කාලය ගත කළ රොබර්ට් නොක්ස් අනතුරුව සිරමැදිරියෙන් ගැලවී පැන ගියේය. මන්නාරමේ අරිප්පු නම් ස්ථානයට ලඟා වූ ඔහු එතැනින් බතාවියාවට පැන ගියේය. ක්‍රිස්තු වර්ෂයෙන් 1680 දී ඔහු නැවතත් එංගලන්තයට ළගා විය. මේ ගමන අතරතුර ඔහු විසින් ශ්‍රී ලංකාවේ දී තමන් ලත් අත්දැකීම් පදනම් කොට ගෙන පොතක් රචනා කළේය. An Historical Relation of the*



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*

*Island of Ceylon නම් වූ එම කෘතිය 1681 දී ප්‍රකාශයට පත් විය. ඔහු මෙරට ගත කළ කාලයේ දී එනම් ක්‍රිස්තු වර්ෂයෙන් දහහත්වන සියවසේ ශ්‍රී ලංකාවේ පැවති සමාජය පිළිබිඹු කරන චිත්‍ර සහ විස්තර එම කෘතියට ඇතුළත් ය.*

*ෆර්නා ඕ ඩි ක්වෙරෝස් (Fernão de Queyroz)- කතෝලික ජේසුයිට් නිකායික පූජකවරයෙකු වූ ක්වෙරෝස් පෘතුගීසි ජාතිකයෙකි. 1688 වසරේ දී ශ්‍රී ලංකාව පිළිබඳ ඔහු විසින් Temporal and Spiritual Conquest of Ceylon නමින් කෘතියක් රචනා කළේය. ශ්‍රී ලංකාවට නොපැමිණි ක්වෙරෝස් එම කෘතිය රචනා කරන ලද්දේ ඔහු ඉන්දියාවේ ගත කළ කාලයේ ය.*



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*